මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් යනු සමාජයීය ගැටළුවක් බවට පත්ව තිබෙනා බව අපට අමතක කළ හැකි නොවේ. එහිදී එවැනි සමාජ ගැටළුවක් වාර්තා කිරීමේදී ලේබල්ගත කිරීමකින්, කොන් කිරීමකින් හෝ පුද්ගල ගෞරවය හානි කිරීමකින් තොරව එය වාර්තා කිරීම මාධ්‍ය වගකීමක් බවද පැවසිය යුතුවේ.

එලෙසම, මෙවැනි පුවත් වාර්තාවක් ඔස්සේ අදාළ සමාජ ගැටළුව භාවාතිශය සිරස්තල ඔස්සේ ලඝු කර දැක්වීමද ගැටළුකාරී බව පැවසීමට සිදුවේ. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, "කුඩුවලට පෙම්බැඳි දාහතක් කොටු" වැනි සිරස්තලයකින් සිදුවන්නේ, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය භාවාතිශය ආකාරයකින් දැක්වීම නොවේද? ඒ වෙනුවට මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් හෝ වෙනත් එවැනි යෝග්‍ය යෙදුමක් භාවිතා කිරීම වඩාත් ආචාර ධාර්මික නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina